**කෘෂිකර්ම අමාත්‍යාංශය**

**කොළඹ කොමර්ෂල් පොහොර සමාගම**

# සමාගමේ ලේකම් සේවාව (අධිකාලීනව)

සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගමේ සභාපති විසින්, කොළඹ කොමර්ෂල් සමාගමේ ලේකම් තනතුර සඳහා සුදුසුකම්ලත් ලේකම් ආයතන හෝ අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**යෝග්‍යතා උපමානයන්**

- නීතිඥ වරයකු වීම.

හෝ

- වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත / අධි සාමාජිකත්වය දැරීම

සහ

- සමාගම් ලේකම්වරයකු ලෙස කටයුතු කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචිව සිටීම

සමග

- පිළිගත් ආයතනයක අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම් / අධ්‍යක්‍ෂ මණ්ඩල සමාගම් ලේකම් වශයෙන් වසර 06 ක පළපුරුද්ද.

සමග

**ආයතනික පාලනය -**

මනා අධ්‍යක්‍ෂ – මණ්ඩල රැස්වීම් ශාලා ව්‍යාපාර සම්මුතීන් සහ සමාගම් පනත පරිදි අදාළ අනුමත කිරීම් සහිත අධ්‍යක්‍ෂ මණ්ඩලයේ නිල පැවැරීම්, අධ්‍යක්‍ෂවරුන්ගේ රාජකාරී හා විෂය පථය, අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වලදී වඩාත් උචිත ව්‍යාපාර යොදගැනීම ඇතුළත් ආයතනික පාලනය පිළිබඳ උසස් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලයට මග පෙන්වීම.

**සේවාවන්හි විෂය ක්‍ෂේත්‍රය.**

- අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් පාලනය කෙරෙන ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම සහතික කරලීම සහ අස්තිත්වයේ / සමාගමේ මෙහෙයුම් කෙරෙහි බලපාන වගකීම්, රීති හා රෙගුලාසි පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩලයට මගපෙන්වීම හා උපදෙස් ලබාදීම;
- ඉදිරිපත් කරනු ලබන අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා පරිපූර්ණ හා අඩුතරමින් පහත සඳහන් කරුණු ඇතුළත් ඒවා බව සහතික කරලීම;
  - කාරණයෙහි පසුබිම
  - අදාළ අංශ ප්‍රධානීන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ අත්සන සහිත නිර්දේශ
  - අනුමැතිය බලාපොරොත්තු වන යෝජන සම්මුති
- සාකච්ඡාවට ගැනීමට නියමිත අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමට අඩුතරමින් දින 5 කට පෙර අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් අතර යථා පරිදි බෙදා හරින බව සහතික කරලීම.
- හදිසි / අත්‍යාවශ්‍ය කාරණයක් නොවෙතොත් මිස, සංසරණයන් මගින් අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණ නොගන්නා බව සහතික කරලීම (එය රීතිවලින් බැහැරවීමක් විය යුතු නමුත් සම්මතය නොවිය යුතුය.)
- රැස්වීම් න්‍යායපත්‍ර සභාපති හා සමග විධිමත්ව සකස් කිරීම හා රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා, සිහිකැඳවීම් හෝ ඉදිරිපත් කිරීම් සම්බන්ධව ප්‍රධාන විධායක නිලධාරී හා කළමනාකරණය සමග සම්බන්ධීකරණය වීම
- අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම හා සහභාගිවීම සහ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තා නිවැරදිව හා නිසි ආකාරයට පවත්වාගෙන යාම
- අධ්‍යක්‍ෂ මණ්ඩල උප – කමිටු සඳහාද ලේකම් වශයෙන් කටයුතු කිරීම.
- කොටස් හිමියන් සමග මහාසභා රැස්වීම් පැවැත්වීම හෝ අදාළ වන පරිදි වාර්ෂික කාර්යසාධන සමීක්‍ෂණ රැස්වීම් (APRM) පැවැත්වීම පිණිස අවශ්‍ය කටයුතු පිළියෙළ කිරීම.

වයස : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 50 ට අඩු විය යුතුය.

වාර්ෂික ගාස්තුව : රු. 50,000/-

එක් එක් අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම සඳහා සහභාගිවීමේ ගාස්තුව : රු. 13,500/-

**පොදු :**

ඔබ මේ පිළිබඳ උනන්දුවක් දක්වන්නේ නම් හා අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඔබ සතු වේ නම් තමා විසින්ම පිළියෙළ කරගත් අයදුම්පත් අදාළ සහතික පිටපත් සමග 2023 ජනවාරි 25 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

කරුණාකර අයදුම්කරන තනතුර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කරන්න.

**සැ.යු.** අදාළ සහතික පිටපත් රහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

**සභාපති,**
**කොළඹ කොමර්ෂල් පොහොර සමාගම,**
**හුණුපිටිය, වත්තල.**

**දිනය : 2023 ජනවාරි 10**